# 2023 ක් වූ මාර්තු මස පවත්වන ලද අකුරණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව

| | |
|---|---|
| දිනය | :- 2023.03.10 |
| වේලාව | :- පෙ.ව 9.30 |
| ස්ථානය | :- අකුරණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම් ශාලාව |
| මුලසුන | :- ගරු සභාපති අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා |

**පැමිණීම**

| | |
|---|---|
| 01. ගරු සභාපති | - අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා |
| 02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ජී. ජී. සිරිමල් විජේතුංග මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ජේ. එම්. ඒ. අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්. එෆ්. එම්. අජ්මීර් මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඩී. එච්. ජී. එස්. එම්. මිහුරාර් මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.ඒ.එම්. මුෆීද් මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්.ඒ.යූ. රහ්මාන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්.ඒ.එච්.එම් සව්රාජ් මැතිතුමා |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්.එස්.එම්. හස්වර් මැතිතුමා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.එච්.එම් නසාර් මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එන්.ජී. ගාමිණී වසන්ත කුමාර මැතිතුමා |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඒ. ජී. ස්වර්ණලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්. ආර්. එම්. ඉස්මයිල් මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - බි.කේ.ජී. සීලවතී මැණිකේ මැතිතුමිය |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඩී.ජී. නිල්මිණී දමයන්ති මැතිතුමිය |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්. ඒ. අස්මීර් අලි මැතිතුමා |
| 20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එම්. එම්. නිහිමතුනිසා මැතිතුමිය |
| 21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.එම්.අයි. මොහමඩ් මැතිතුමා |
| 22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ජී.ජී. නිරංජන් කරුණාරත්න මැතිතුමා |
| 23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා |
| 24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඒ.ආර්.එම් සරුක් මැතිතුමා |
| 25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - යූ.එස්.එම් හුසෙයින් මැතිතුමා |
| 26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එච්.එම් ශාන්ත සෙනවිරත්න මැතිතුමා |
| 27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.ඒ සිත්ති රෝසාන් මැතිතුමිය |

**නොපැමිණීම**

| | |
|---|---|
| 01. ගරු ගරු උප සභාපති | - ඒ. එම්. සරත් අමරකෝන් මැතිතුමා |
| 02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - එෆ්. නිස්රිනා ෂරුක් මැතිතුමිය |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - කේ.එම්. නිලාම් මැතිතුමා |

**සහභාගී වූ නිලධාරීන්**

| | |
|---|---|
| 01. ලේකම් | - ඩි.ජී.එම්.බී රණසිංහ මයා |
| 02. සංවර්ධන නිලධාරී | - එච්. එම්. ඩබ්. බී. නයනමාලි මිය |

## (අ) පසුගිය මහා සභා වාර්තාව සහා සම්මත කිරීම

2023 පෙබරවාරි මස 02 වන දින පැවති සාමාන්‍ය මහා සභාවේ වාර්තාව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු මන්ත්‍රීතුමියන්ලාට ලැබී ඇති බැවින් එම වාර්තාවේ සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
සංශෝධන නොමැති බැවින් 2023 පෙබරවාරි මස 02 වන දින පැවති සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## (ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**(ආ.1** රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන්, පළාත් පාළන දෙපාර්තමේන්තුවෙන් මේ මස මන්ත්‍රී දීමනාව මේ වන තෙක් ප්‍රතිපූර්ණය කර නොමැති බැවින් එම මුදල් ප්‍රතිපූර්ණය වීමෙන් පසුව මන්ත්‍රී දීමනා ගෙවීම සිදු කරන බව සභාපති තුමා විසින් සභාව දැනුම්වත් කරන ලදී.

## (ඇ) සභාවට ලැබී ඇති ලිපි, සංදේශ, පෙත්සම් ඉදිරිපත් කිරීම - කිසිවක් නැත

## (ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - කිසිවක් නැත

## (ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා

### ඉ.1 ගරු සභාපති අයි. එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා

**ඉ.1.1** අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ අංක 190/1/A කඩ කාමරය A.L.A. කරීම් මයා විසින් බදු පදනම මත ලබා ගෙන ඇති අතර ඔහු 2008.01.19 වන දින මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන S.A.U.S. පවුසියා උම්මා මිය විසින් කඩ කාමරයේ බදු අයිතිය ඇය හට පවරා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. එයට අදාළ ලිපි ලේඛන සභාව වෙත ඉදිරිපත් කර ඇති බැවින් 190/1/A කඩ කාමරයෙහි බදු අයිතිය S.A.U.S. පවුසියා උම්මා මිය හට ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. එච්. ජී. එස්. එම්. මිහුරාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.1 අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ අංක 190/1/A කඩ කාමරය A.L.A. කරීම් මයා විසින් බදු පදනම මත ලබා ගෙන ඇති අතර ඔහු 2008.01.19 වන දින මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන S.A.U.S. පවුසියා උම්මා මිය විසින් කඩ කාමරයේ බදු අයිතිය ඇය හට පවරා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. එයට අදාළ ලිපි ලේඛන සභාව වෙත ඉදිරිපත් කර ඇති බැවින් 190/1/A කඩ කාමරයෙහි බදු අයිතිය S.A.U.S. පවුසියා උම්මා මිය හට ලබාදීම සුදුසු බව මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.1.2** අකුරණ ප්‍රාදේශීය සභාව සතු පහත අංක දරණ වාහන භාවිතයෙන් තොරව අක්‍රීය මට්ටමේ පවතින බැවින් එම වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

01. CP GS - 2423 ලොරි රථය - ක්ලච් හැඩලය අක්‍රීය වී ගියර් දැමීම අපහසු බව වාර්තා කර ඇත
02. CP RX - 7675 ජල බවුසරය - ඇතුළත මල බැඳී අති බැවින් භාවිතයට ගත නොහැකි බව වාර්තා කර ඇත

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. ගාමිණී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,
අකුරණ ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් රථ දෙකක් භාවිතයෙන් ඉවත් කර පවතින බැවින් එම රථ දෙක ද අලුත් වැඩියා කර භාවිතයට ගැනීම වඩාත් සුදුසු වන බව සභාව දැනුම්වත් කරන ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.1.2 අකුරණ ප්‍රාදේශීය සභාව සතු පහත අංක දරණ වාහන භාවිතයෙන් තොරව අක්‍රීය මට්ටමේ පවතින බැවින් එම වාහන යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ අනුව අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**01.CP GS - 2423 ලොරි රථය**

**02.CP RX - 7675 ජල බවුසරය**

**ඉ.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ. එම්. ඒ. අනුරුද්ධ කුමාර ජයසුන්දර මැතිතුමාගේ යෝජනා**

**ඉ.2.1** අරඹේපොළ ප්‍රධාන මාර්ගයේ සිට වැල්හිරිය අතුරු මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා කැපීම සඳහා රු. 100,000.00 ක මුදලක් වෙන් කර දෙන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.2.1 අරඹේපොළ ප්‍රධාන මාර්ගයේ සිට වැල්හිරිය අතුරු මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා කැපීම සඳහා රු. 100,000.00 ක මුදලක් වෙන් කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3 ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමාගේ යෝජනා (2023.02.03, 2023.02.10, 2023.02.20 සහ 2023.02.24 දිනවල පැවති මුදල් කමිටු නිර්දේශ )**

**ඉ.3.1** අලවතුගොඩ බස් නැවතුම්පොළ අංක 02 දරණ කඩ කාමරය ඩී. ජී. පියසේන මහතා විසින් බදු පදනම මත ලබා ගෙන නව තක්සේරුවට අනුව ගිවිසුම් ගත නොවීම හා හිග මුදල් නොගෙවීම යන කරුණු මත 2023.01.27 පැවති මුදල් කමිටුව මගින් මෙම කඩ කාමරය මුද්‍රා තැබීමට අනුමැතිය ලබා දී ඇති අතර, එම තීරණයට අනුව 2023.02.06 වන දින මුද්‍රා තබා සභාවට භාර ගත් බැවින් අලවතුගොඩ බස් නැවතුම්පොළ කඩ කාමර අංක 02 සඳහා නැවත ටෙන්ඩර් මගින් විවෘත ලංසු කැඳවීමක් සිදු කර කඩ කාමරය බදු පදනම මත ලබා දීම සුදුසු බවට වන මුදල් කමිටු නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.අයි. මොහමඩ් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.1 අලවතුගොඩ බස් නැවතුම්පොළ අංක 02 දරණ කඩ කාමරය ඩී. ජී. පියසේන මහතා විසින් බදු පදනම මත ලබා ගෙන නව තක්සේරුවට අනුව ගිවිසුම් ගත නොවීම හා හිග මුදල් නොගෙවීම යන කරුණු මත 2023.01.27 පැවති මුදල් කමිටුව මගින් මෙම කඩ කාමරය මුද්‍රා තැබීමට අනුමැතිය ලබා දී ඇති අතර, එම තීරණයට අනුව 2023.02.06 වන දින මුද්‍රා තබා සභාවට භාර ගත් බැවින් අලවතුගොඩ බස් නැවතුම්පොළ කඩ කාමර අංක 02 සඳහා නැවත ටෙන්ඩර් මගින් විවෘත ලංසු කැඳවීමක් සිදු කර කඩ කාමරය බදු පදනම මත ලබා දීම සුදුසු බවට වන මුදල් කමිටු නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.2** අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා හා තක්සේරු ප්‍රතිශෝධන වැඩසටහනේ නිලධාරීන්ගේ සහය සඳහා තාවකාලික පදනම මත යොදවාගත් සේවකයින් 12 දෙනාගේ සේවය 2022.12.20 සිට 2023.03.19 දක්වා මාස තුනක් දක්වා දීර්ඝ කිරීම සඳහා වූ අනුමැතිය 2020.02.28 දිනැති ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී ඇත. එම ලිපියේ කොන්දේසි වලට යටත්ව තව දුරටත් ඉහත කාර්ය ඉටු කර ගැනීම සඳහා එම සේවකයින් සේවයේ යෙදවීමට අවශ්‍ය වන බැවින් නැවත සේවයේ යොදවා ගැනීමේ කාලය 2023.03.20 දින සිට 2023.06.19 වන දින දක්වා මාස තුනක කාලයක් දීර්ඝ කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය පළාත් පාලන කොමසාරිස්ගෙන් ලබා ගත යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය මත අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා හා තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සඳහා තාවකාලික පදනම මත යොදවාගත් සේවකයින් 12 දෙනාගේ සේවය 2023.03.20 දින සිට 2023.06.19 වන දින දක්වා මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. අස්මීර් අලි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.2 අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා හා තක්සේරු ප්‍රතිශෝධන වැඩසටහනේ නිලධාරීන්ගේ සහය සඳහා තාවකාලික පදනම මත යොදවාගත් සේවකයින් 12 දෙනාගේ සේවය 2022.12.20 සිට 2023.03.19 දක්වා මාස තුනක් දක්වා දීර්ඝ කිරීම සඳහා වූ අනුමැතිය 2020.02.28 දිනැති ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී ඇත. එම ලිපියේ කොන්දේසි වලට යටත්ව තව දුරටත් ඉහත කාර්ය ඉටු කර ගැනීම සඳහා එම සේවකයින් සේවයේ යෙදවීමට අවශ්‍ය වන බැවින් නැවත සේවයේ යොදවා ගැනීමේ කාලය 2023.03.20 දින සිට 2023.06.19 වන දින දක්වා මාස තුනක කාලයක් දීර්ඝ කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය පළාත් පාලන කොමසාරිස්ගෙන් ලබා ගත යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය මත අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා හා තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සඳහා තාවකාලික පදනම මත යොදවාගත් සේවකයින් 12 දෙනාගේ සේවය 2023.03.20 දින සිට 2023.06.19 වන දින දක්වා මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.3** අකුරණ ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර සෞඛ්‍ය කම්කරුවන් 06 දෙනෙකු සේවයේ යොදවා ඇති අතර එක් අයෙකුට රු.4000.00 බැගින් නිල ඇඳුම් දීමනාවක් ලබා දෙයි. නමුත් දැනට අනියම් සෞඛ්‍ය කම්කරුවන් 08 දෙනෙකු ද සේවයේ යෙදී සිටින බැවින් එම සේවකින් සඳහා ද නිල ඇඳුම් (ටී ෂර්ට් එකක් සහ දණහිස දක්වා කාකි කලිසම) දීමනාවක් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙසට පරිසර නිලධාරී විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ස්ථිර සෞඛ්‍ය කම්කරුවන් සඳහා ද නිල ඇඳුම් දීමනාව ලබා දෙන බැවින් දැනට සේවයේ යෙදී සිටින

අනියම් සෞඛ්‍යය කම්කරුවන් 08 දෙනා හට ද එක් අයෙකුට රු.4000.00 බැගින් වාර්ෂික නිල ඇඳුම් දීමනාවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. නිරංජන් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.3 අකුරණ ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර සෞඛ්‍යය කම්කරුවන් 06 දෙනෙකු සේවයේ යොදවා ඇති අතර එක් අයෙකුට රු.4000.00 බැගින් නිල ඇඳුම් දීමනාවක් ලබා දෙයි. නමුත් දැනට අනියම් සෞඛ්‍යය කම්කරුවන් 08 දෙනෙකු ද සේවයේ යෙදී සිටින බැවින් එම සේවකින් සඳහා ද නිල ඇඳුම් (ටී ෂර්ට් එකක් සහ දණහිස දක්වා කාකි කලිසම) දීමනාවක් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙසට පරිසර නිලධාරී විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ස්ථිර සෞඛ්‍යය කම්කරුවන් සඳහා ද නිල ඇඳුම් දීමනාව ලබා දෙන බැවින් දැනට සේවයේ යෙදී සිටින අනියම් සෞඛ්‍යය කම්කරුවන් 08 දෙනා හට ද එක් අයෙකුට රු.4000.00 බැගින් වාර්ෂික නිල ඇඳුම් දීමනාවක් ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.4** පොදු අරමුදල් 2023 යටතේ අලවතුගොඩ නගරයේ වැසිකිළි පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තු වටිනාකම රු. 5,023,738.07 කි. මෙම ඇස්තමේන්තුව සඳහා නියමිත සීමිත මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් අලවතුගොඩ නගරයේ වැසිකිළි පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වූ රු. 5,023,738.07 ක සංශෝධිත ඇස්තමේන්තුව සඳහා වන මුදල් කමිටු නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ටී.ද අල්විස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.4 පොදු අරමුදල් 2023 යටතේ අලවතුගොඩ නගරයේ වැසිකිළි පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තු වටිනාකම රු. 5,023,738.07 කි. මෙම ඇස්තමේන්තුව සඳහා නියමිත සීමිත මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් අලවතුගොඩ නගරයේ වැසිකිළි පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වූ රු. 5,023,738.07 ක සංශෝධිත ඇස්තමේන්තුව සඳහා වන මුදල් කමිටු නිර්දේශයට අනුමැතිය ලබා දීමසුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.5** 2023.02.02 පැවති මහා සභාවේ යෝජනා අංක ඉ .1.9 යටතේ සභා සම්මත වූ බල ප්‍රදේශයේ හදිසි ආපදා තත්ත්වයටලක් වූ මාර්ග ප්‍රවාහනය හා අත්‍යවශ්‍ය සේවා සපයා ගැනීමට නොහැකි මාර්ග පිළිසකර කර ගැනීම සඳහා වූ යෝජනාවට අදාළ අස්නාපුර පඩිපෙළ සංවර්ධනය කිරීම යටතේ පහත ඇස්තමේන්තු අංක i හා ii සඳහා මුදල් කමිටු නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

**i. අස්නාපුර මාර්ගය සංවර්ධනය කිරීම - පොදු අරමුදල් 2023**

මෙම සංවර්ධන යෝජනාව සඳහා වූ ඇස්තමේන්තුවේ වටිනාකම රු. 1,000,000.00 කි. මෙම ඇස්තමේන්තුව සඳහා නියමිත මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් අස්නාපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ රු. 1,000,000.00 ක ඇස්තමේන්තුව සඳහා මුදල් කමිටුවේ නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

**ii. අස්නාපුර පඩිපෙළ හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම - පොදු අරමුදල් 2023**

මෙම සංවර්ධන යෝජනාව සඳහා වූ ඇස්තමේන්තුවේ වටිනාකම රු. 900,000.00 කි. මෙම ඇස්තමේන්තුව සඳහා නියමිත මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් අස්නාපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ රු. 900,000.00 ක ඇස්තමේන්තුව සඳහා මුදල් කමිටුවේ නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්ලිව්.ඒ.ඒ.හජ්ජු මොහිදීන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.5 202302.02 පැවති මහා සභාවේ යෝජනා අංක ඉ .1.9 යටතේ සභා සම්මත වූ බල ප්‍රදේශයේ හදිසි ආපදා තත්ත්වයටලක් වූ මාර්ග ප්‍රවාහනය හා අත්‍යවශ්‍ය සේවා සපයා ගැනීමට නොහැකි මාර්ග පිළිසකර කර ගැනීම සඳහා වූ යෝජනාවට අදාළ අස්නාපුර පඩිපෙළ සංවර්ධනය කිරීම යටතේ පහත ඇස්තමේන්තු අංක i හා ii සඳහා මුදල් කමිටු නිර්දේශයට අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.3.6** 2023 සංවර්ධන යෝජනා යටතේ පහත ව්‍යාපෘතීන් සඳහා වන මුදල් කමිටු නිර්දේශ තාක්ෂණික නිලධාරී විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

i. දොඩම්ගොල්ල මාර්ගයේ පළුදු වී ඇති ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම

ii. විලාන පල්ලේගම ඇල්ලේකඩේ මහජන පුස්තකාලය සඳහා CCTV පද්ධතියක් සවි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.3.6 2023 සංවර්ධන යෝජනා යටතේ පහත ව්‍යාපෘතීන් සඳහා වන මුදල් කමිටු නිර්දේශ තාක්ෂණික නිලධාරී විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**i. දොඩම්ගොල්ල මාර්ගයේ පළුදු වී ඇති ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම**

**ii. විලාන පල්ලේගම ඇල්ලේකඩේ මහජන පුස්තකාලය සඳහා CCTV පද්ධතියක් සවි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම**

**<u>ඉ.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමාගේ යෝජනා (2023.02.27 දින පැවති කර්මාන්ත කමිටු නිර්දේශ )</u>**

**ඉ.4.1** 2023.02.27 දිනැති කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීමට අදාළ අංක 09 - 37 දක්වා වන නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ජී. සිරිමල් විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ජී. සිරිමල් විජේතුංග මැතිතුමා,
මෙම මැතිවරණ ආසන්න සමයේ ප්‍රාදේශීය සභාවේ නව ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිපාදන යොදවන ආකාරය පිළිබඳව සභාවෙන් විමසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.එම් සරුක් මැතිතුමා,
පළාත් පාලන මැතිවරණ ආසන්න සමයේ නව ව්‍යාපෘතීන් වලට ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳ පවතින ගැටළු සම්බන්ධයෙන් විමසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා,
විලාන කොට්ඨාසයේ ගංවතුර අවස්ථා වලදී හා ගල් පෙරලීම හේතුවෙන් සිදු වූ ආපදා තත්ත්වයන් වලදී කොට්ඨාසයේ මන්ත්‍රීවරයාගේ මැදිහත්වීම පිළිබඳ ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,
මෙම මාර්ගයට ගල පෙරලීම නිසා සිදු වූ හානිය හා මාර්ගය අවහිර වීම පිළිබඳව අදාළ විහාරස්ථානයේ නායක ස්වාමින් වහන්සේ තමා අමතා මේ පිළිබඳව සොයා බලා සුදුසු පියවර ගන්නා ලෙස දැන්වූ බව ප්‍රකාශ කරන ලදී. මින් අනතුරුව ස්ථානීය පරීක්ෂාවක් සිදු කළ බව ද එහි දී එම ආපදාවෙන් සිදු වී ඇති අවහිරතාවය හා අවදානම ගැන සළකා බලා නිසි ක්‍රමවේදයට අනුව ඇස්තමේන්තු සකස් කර මෙම ව්‍යාපෘතිය සිදු කළ බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එෆ්. එම්. අජ්මීර් මැතිතුමා,
පළාත් පාලන මැතිවරණ ආසන්නවීම හේතුවෙන් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් වන ආකාරය පිළිබඳ විමසා සිටි අතර පෙර අවස්ථාවකදී කුරුගොඩ මාර්ගයේ කාණුවක් ඉදිකිරීම හා දෙල්ගස්තැන්න මංසන්ධියේ කුඩා උද්‍යාන ව්‍යාපෘතියක් සම්බන්ධ යෝජනාවන් ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් විමසා සිටින ලදී. තවද පිගාඔය ව්‍යාපෘතියට පෞගලික ආයතනයකින් යන්ත්‍ර ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ විමසා සිටි අතර ඒ සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර පිළිබඳ සභාව දැනුම්වත් කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඒ. ජී. ස්වර්ණලතා මැතිතුමිය,
2022 සිට කාර්මික කමිටුවට ඉදිරිපත් කරන ලද විලාන මාර්ගයේ බෝක්කුවක් සම්බන්ධ යෝජනාව පිළිබඳ විමසා සිටි අතර මේ වන විට යම් පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයෙක් විසින් මෙම කමිටු අනුමැතිය ලැබී නොමැති මෙම ව්‍යාපෘතිය සිදු කර ඇති බව දන්වා සිටි අතර එම අපේක්ෂකයාගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා මෙම ව්‍යාපෘතීන් සිදු කරන බවට වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. ගාමිණී වසන්ත කුමාර මැතිතුමා,
තමන් හා කරුණාදාස මන්ත්‍රී වරයා විසින් ප්‍රතිපාදන වෙන් කර සංවර්ධනය කරන ලද මාර්ග ව්‍යාපෘතියක පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයෙකු විසින් බෝක්කු බට යොදා සිදු කරනු ලබන ව්‍යාපෘතිය පිළිබඳව සභාව දැනුම්වත් කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා,
ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් වන ආකාරය සහ එහි විනිවිද භාවය පිළිබඳ ගැටලු පවතින්නේ නම් ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ගේ සහ අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාගෙන් මේ සම්බන්ධයෙන් විමසීම් සිදු කර තොරතුරු ලබා ගෙන නීතිමය තත්ත්වයන් අනුව එම ගැටලු නිරාකරනය කර ගන්නා ලෙස සභාව දැනුම්වත් කරන ලදී. එමෙන්ම මැතිවරණයක් ආසන්නයේ සිදු වන සාමාන්‍ය කටයුතු හා එහි පවතින ගැටලු සහගත තත්ත්වයන් පිළිබඳව ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.4.1 2023.02.27 දිනැති කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත ඉටු කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීමට අදාළ අංක 09 - 37 දක්වා වන නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**<u>ප්‍රාදේශීය සභා රීති මාලාවේ 11 (8) රීතිය අනුව කල් දී නොමැති යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම් ඉස්තිහාර් මැතිතුමාගේ යෝජනා</u>**

**ඉ.5.1** අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 190/2/16 J.L.M. ඉස්මයිල් මයා විසින් බදු පදනම මත ලබා ගෙන සිටි අතර, ඔහු විසින් නව ගිවිසුමට ගිවිසුම්ගත නොවීම මත 2023.02.20 වන දින කඩ කාමරය මුද්‍රා තබන ලදී. එහෙත් 2023.02.27 වන දින J.L.M. ඉස්මයිල් මයා විසින් ඔහු අසනීප තත්ත්වයේ පසු වන බැවින් ඔහුගේ එකම පුතා වන I.R මොහොමඩ් නමට මෙම කඩ කාමරයේ බදු අයිතිය පවරා දෙන ලෙසට ඉල්ලා සිටි අතර මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එච්.එම් නසාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.5.1 අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 190/2/16 J.L.M. ඉස්මයිල් මයා විසින් බදු පදනම මත ලබා ගෙන සිටි අතර, ඔහු විසින් නව ගිවිසුමට ගිවිසුම් ගත නොවීම මත 2023.02.20 වන දින කඩ කාමරය මුද්‍රා තබන ලදී. එහෙත් 2023.02.27 වන දින J.L.M. ඉස්මයිල් මයා විසින් ඔහු අසනීප තත්ත්වයේ පසු වන බැවින් ඔහුගේ එකම පුතා වන I.R මොහොමඩ් නමට මෙම කඩ කාමරයේ බදු අයිතිය පවරා දෙන ලෙසට ඉල්ලා සිටි අතර දීර්ඝ කාලීනව බදු පදනම මත ලබා ගෙන සිටි බැවින් මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ඉ.5.2** අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 190/2/2 W.G.M.A. රාසික් මයා විසින් බදු පදනම මත ලබා ගෙන සිටි අතර, ඔහු විසින් නව ගිවිසුමට ගිවිසුම්ගත නොවීම මත 2023.02.20 වන දින කඩ කාමරය මුද්‍රා තබන ලදී. එහෙත් 2023.03.09 වන දින ගිවිසුම් අත්සන් කිරීමට එකගතාවය පලකර සිටි අතර එම කඩ කාමරය බදු පදනම මත ලබා දෙන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත් කර අති බැවින් එය සළකා බලා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එච්.එම් නසාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ගරු සභාවේ යම් බෙදීමක් හෝ සංශෝධනයක් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.
බෙදීමක් සඳහා ඉල්ලීමක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඉ.5.2 අකුරණ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 190/2/2 W.G.M.A. රාසික් මයා විසින් බදු පදනම මත ලබා ගෙන සිටි අතර, ඔහු විසින් නව ගිවිසුමට ගිවිසුම්ගත නොවීම මත 2023.02.20 වන දින කඩ කාමරය මුද්‍රා තබන ලදී. එහෙත් 2023.03.09 වන දින ගිවිසුම් අත්සන් කිරීමට එකගතාවය පලකර සිටි අතර එම කඩ කාමරය බදු පදනම මත ලබා දෙන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බැවින් එය සළකා බලා දීර්ඝ කාලීනව බදු පදනම මත ලබා ගෙන සිටි බැවින් අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**(ඊ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**ඊ.1 මුදල් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම**

2023 පෙබරවාරි මස 03, 10,20 සහ.24 යන දිනයන්හි පැවති මුදල් කමිටු වාර්තා, මුදල් කමිටු ගරු සභාපති අයි.එම්. ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**ඊ.2 පරිසර කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

2023 පෙබරවාරි මස 27 දින පැවති පරිසර කමිටු වාර්තාව, පරිසර කමිටු ගරු සභාපති එම්.එෆ්.එම්.අජ්මීර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**ඊ.3 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

2023 පෙබරවාරි මස 16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව නිවාස හා ප්රජා සංවර්ධන කමිටු ගරු සභාපති වයි.ජී. චමින්ද තිලකරත්න මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**ඊ.4 කර්මාන්ත කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම**

2023 පෙබරවාරි මස 27 දින පැවති කර්මාන්ත කමිටු වාර්තාව කර්මාන්ත කමිටු ගරු සභාපති ආර්.ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**( උ) ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම**

2022 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව ගරු සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**(ඌ ) වෙනත් කරුණු**

**1.ඒ.ආර්.එම් සරුක් මැතිතුමාගේ අදහස් දැක්වීම**

2023.02.20 මුදල් කාරක සභා වාර්තාවේ පිගා ඔය ව්‍යාපෘතියේ යන්ත්‍ර ලබා ගැනීම සඳහා මූන් ලංකා කන්ස්ට්‍රක්ෂන් ආයතනයට රු .379,000.00 ක ගෙවීමක් සිදු කිරීම සහ එම වාර්තාවේම අකුරණ නගරයේ ආපදා තත්ත්වය හේතුවෙන් ඇති වූ කසළ යාළගහවෙල කසළ අංගනයට බැහැර කිරීම සම්බන්ධයෙන් සිදු කළ රු. 306,300.00 ක ගෙවීම් වලට තමා පෞද්ගලිකවම විරුද්ධ වන බවට සභාවට දැනුම් දෙන ලදී.

**2. ආර්. ජී.අමරජීව ඉන්ද්‍ර කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම**

පළමුව සභා රීති සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ගේ දැනුම්වත් භාවය පිළිබඳ අදහස් දැක්වූ අතර මන්ත්‍රීවරුන් කාරක සභා වලදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් කර සිටින ලදී. තවද විලාන මාර්ගයට ගලක් පෙරලීමෙන් සිදු වූ හානිය පිළිබඳ අදහස් දැක්වූ අතර මෙහි දී ඇස්තමේන්තුවේ පවතී ගැටලු සම්බන්ධයෙන් දැන්වූ අතර සංශෝධිත ඇස්තමේන්තුවක් නැවත ඉදිරිපත් කර එම ව්‍යාපෘතිය සිදු කර ඇති බව ද , ඒ අවස්ථා වලට මෙවර පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයෙකු ද සහභාගී වී ඇති බව දන්වා සිටින ලදී. එමෙන්ම බලකඩුව මාර්ගයක බෝක්කු බට දැමීම සම්බන්ධයෙන් අදහස් දක්වා සිටි අතර ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් ලිපිය අනුව ස්ථානීය පරීක්ෂාව සිදු කළ බව දන්වා සිටි අතර එම අවස්ථාවේ දී අදාළ ස්ථානයට අවශ්‍යය බෝක්කු බට සපයා තිබූ බව සහ පෙර අවස්ථාවක දී මෙම ව්‍යාපෘතියට අදාළව ඇස්තමේන්තු සකස් කර ඇති බව ද දන්වා සිටින ලදී. තවද ව්‍යාපෘතීන් සිදු වන ක්‍රමවේදය පිළිබඳ සියලුදෙනාගේ අවදානය යොමු විය යුතු බව හා මැතිවරණ සමයේ සියලුම අපේක්ෂකයන්ට සම අවස්ථා ලබා දී කටයුතු කළ යුතු බව ප්‍රකාශ කර සිටින ලදී. සියලුම දෙනා ගැටලු විසඳා ගැනීමේ දී සාකච්ඡාවෙන් හා සම්මුතියෙන් එම කටයුතු සිදු කිරීම සුදුසු බව මෙන්ම මන්ත්‍රීවරුන් සියලුම වාර්තා හොඳින් පරිශීලනය කර තොරතුරු ඉදිරිපත් කරන්නේ නම් වඩාත් සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

**3.ගරු මහජන නියෝජිතයින්ගේ නිවාඩු අනුමත කිරීම.**

ගරු උප සභාපති ඒ. එම්. සරත් අමරකෝන් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එෆ්. නිස්රිනා ෂරුක් මැතිතුමිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. නිලාම් මැතිතුමා මැතිතුමා අද දින මහා සභාවට නොපැමිණෙන බව දුරකථනයෙන් දන්වා නිවාඩු අනුමත කර දෙන මෙන් සිදු කළ ඉල්ලීම ගරු ප්‍රාදේශීය සභා සභාපති අයි.එම්.ඉස්තිහාර් මැතිතුමා විසින් සභාගත කරන ලදී.

**<u>(එ) ඉදිරි මහා සභා දිනය තීරණය කිරීම</u>**

- ඉදිරි මහා සභා දිනය 2023 අප්‍රේල් 18 වන දින බව සභාවට දැනුම් දෙන ලදී.

**<u>(ඒ) මහා සභාව අවසන් කිරීම</u>**

එදිනට නියමිත න්‍යාය පත්‍රයේ කටයුතු අවසන් වූ බැවින් පෙ.ව 10.21 ට මහා සභා කටයුතු අවසන් විය.

අයි.එම් ඉස්තිහාර්,

සභාපති,

අකුරණ ප්‍රාදේශීය සභාව,

අලවතුගොඩ.